ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
National Secretariat for Elders

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා *-செயலூக்கமான முதுமையை நோக்கி -* ***Towards an active ageing***

මගේ අංකය / எனது இல. / My No.	NSE/E/01/Annual Trans-(2026)	ඔබේ අංකය / உனது இல. / Your No.	දිනය / திகதி / Date 2025.06.25

දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් මඟින්,

සියලුම වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් වෙත ,

<u>වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026</u>

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පත්වීම් ලැබ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්තව සේවය කරනු ලබන වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගෙන් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවනු ලැබේ.

02. වාර්ෂික ස්ථාන මාරු කැඳවීමට අදාළ ස්ථානමාරු පටිපාටිය හා ස්ථාන මාරු අයදුම්පත්‍රය, Srilankaeldercare.gov.lk යන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වෙබ් පිටුවේ පළ කර ඇත.

03. 2025.12.31 දින වන විට සේවාවේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලැබූ හා කිසියම් සේවා ස්ථානයක වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරු වීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබන අතර, එකම සේවා ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

04. ස්ථාන මාරු ඉල්ලුම් කරන සියලුම නිලධාරීන් මේ සමඟ යොමුකර ඇති ආකෘතිය අනුව පමණක් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායාරූපයක් හෝ ස්කෑන් කරන ලද පිටපතක් ඔබගේ නම හා වර්තමාන සේවා ස්ථානය නිවැරදිව සඳහන් කර nseannualtransfer2026@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමෙන් පසුව ලියාපදිංචි තැපෑල මඟින් පමණක් 2025.07.31 දින හෝ එදිනට පෙර මා වෙත එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම අයදුම්පත්‍ර ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

05. තවද, සේවා අවශ්‍යතාවය මත තවදුරටත් දැනට සේවය කරනු ලබන සේවා ස්ථානයේ රඳවාගැනීමට අවශ්‍ය නිලධාරීන් සිටීනම් හෝ වෛද්‍ය සහතික මඟින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙළෙන ස්ථානමාරු නොකළ යුතු නිලධාරීන් සිටීනම්, ඔවුන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් / පුද්ගලිකවම සනාථ කර ඉදිරිපත් කළ යුතු වේ. මෙවැනි කරුණු සම්බන්ධයෙන් වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හේතුවෙන්, ස්ථාන මාරු චක්‍රයේ අනෙකුත් නිලධාරීන් අගතියට පත්වීම සිදුවන බැවින්, එවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමෙන් අනතුරුව සලකා බැලීමේ හැකියාවක් නොමැති බව කාරුණිකව සඳහන් කරමි.

06. ස්ථාන මාරු කමිටුවේ නිර්දේශය මත 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු ක්‍රියාත්මක කරනු ඇත. ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් සමාලෝචන කමිටු සභාපතිත්වය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දරනු ඇත.

කේ. චතුර මිහිදුම්
අධ්‍යක්ෂ

පිටපත : අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම සඳහා

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
ගිණුම් අංශය : 0112054138